**ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය - 2021**

ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ, පහසුකම් ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 ඔක්තෝබර් 28 දින එළඹි අංක 3425 එස්ආර්අයි (එස්එෆ්) දරණ ණය ගිවිසුමේ iv ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස්දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශක්‍යතා අධ්‍යයනය, විස්තරාත්මක සැලසුම් සහ ප්‍රසම්පාදන ලේඛන පිළියෙල කිරීම සහ ව්‍යාපෘතිය ආරම්භක අදියර තුළදී ක්‍රියාත්මක කිරීමේ සහාය ලබා දීම මඟින් මාර්ග, දුම්රිය හා වරාය යන උප අංශවල ප්‍රමුඛතා ප්‍රවාහන ව්‍යාපෘතිවල ආරම්භක කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු. මිලියන 1697.48 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 11.34 ක් වන අතර ඉන් රු. මිලියන 1496.90 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 10 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි වටිනාකම වූ රු. මිලියන 200.58 ශ්‍රී ලංකා රජයේ අරමුදල් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජනවාරි 28 දින ආරම්භ කරන ලද අතර, 2023 ජුනි 30 දින වන විට අවසන් කිරීමට නියමිතය.

## 1.3 මතය

2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහයන් ගෙන් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ අයුරින් පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණන කාලය තුළදී හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලනයේ වැදගත් අකාර්යක්ෂමතා ඇතුළුව අනෙකුත් කරුණු අතරින් වැදගත් විගණන සොයාගැනීම්, සම්බන්ධ පාර්ශවයන් සමඟ සන්නිවේදනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම.**

**2.1** **ගිණුම්කරණ අඩුපාඩු.**

| විගණන ගැටළුව. | වටිනාකම (රු.මිලියන) | කළමනාකරණයේ අදහස් දැක්වීම. | විගණනකගේ නිර්දේශ. |
|---|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහා බැංකු අග්‍රිම ගිණුම් ප්‍රකාශය විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එමනිසා, 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශණ තුළ සඳහන් කර ඇති රු.මිලියන 44.09 ක අග්‍රිම ශේෂය සහ රු. මිලියන 4.24 ක විනිමය අනුපාත වෙනස සැසඳීමට නොහැකි විය. | 48.33 | එකඟ වේ. සාමාන්‍ය යෙන් සෑම මාසයක් අවසානයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගිණුම් ප්‍රකාශ නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉල්ලීම් කිහිපයක් සිදු කළ ද දෙසැම්බර් 31 දිනට ගිණුම් ප්‍රකාශ තවමත් නොලැබුණි. | මූල්‍ය ප්‍රකාශන තුළ සඳහන් සියලුම ශේෂයන් වලට අදාළ මූලාශ්‍ර ලේඛන විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

**3.** **භෞතික කාර්යසාධනය.**

**3.1** **ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය.**

| විගණන ගැටළුව. | කළමනාකරණයේ අදහස් දැක්වීම. | විගණනකගේ නිර්දේශ. |
|---|---|---|
| ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමේ කාලය අවසන් වී තිබුණද අධිවේගී මාර්ග සංවර්ධන සැලැස්ම 2021 දෙසැම්බර් 31 දින වන විටත් සකස් කර නොතිබුණි. | මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා නොදීම හේතුවෙන් අධිවේගී මාර්ග සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කර නොමැත. | මහා භාණ්ඩාගාරයේ නිගමනයන් ඇතිව ජාතික අවශ්‍යතාවය සලසා බලා ව්‍යාපෘතිය නැවත උපලේඛණගත කල යුතුයි. |

**3.2 ඌණ උපයෝජිත සම්පත්.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම. | විගණනකගේ නිර්දේශ. |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, මාර්ග කොටසේ ඇස්තමේන්තු හා පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 11.34 ක් වන අතර, ඉන් එක්සත් ජනපද ඩොලර් මිලියන 10 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් සපයනු ලැබේ. ඉහත සපයන ලද තොරතුරු වලට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් එක්සත් ජනපද ඩොලර් මිලියන 7.41 ක් උපයෝජනය කළ යුතු තිබුණි. කෙසේ වුවත්, එදිනට එක්සත් ජනපද ඩොලර් මිලියන 2.6 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | අධිවේගී මාර්ග සංවර්ධන සැලැස්ම සඳහා උපදේශන සේවාව මේ දක්වා ආරම්භ කර නොමැත.මෙනිසා ආසියානු සංවර්ධන බැංකුවේ ණය යටතේ 2021 සඳහා වෙන් කරන ලද මුදල සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ නොහැකි විය. | ව්‍යාපෘතිය අරමුදල් අපේක්ෂිත අරමුණු මතම භාවිතා කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා දේශීය අරමුදල් වල ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.මිලියන 40 ක් සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘති විසින් උපයෝජනය කර නොමැති බව නිරීක්ෂණය කරන ලදී | අධිවේගි සංවර්ධන සැලැස්ම සඳහා උපදේශන සේවාව මේ දක්වා ආරම්භ කර නොමැත. ඒමනිසා ආසියානු සංවර්ධන බැංකුවේ ණය යටතේ 2021 සඳහා වෙන් කරන ලද මුදල සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ නොහැකි විය. | ව්‍යාපෘතිය විසින් අරමුදල් අපේක්ෂිත අරමුණු මතම භාවිතා කළ යුතුය නැතහොත් වැඩ සැලැස්මට අනුව වෙන්කිරීම් ප්‍රතිශෝධනය කළ ගත යුතුය. |